ET/SSS/2022(2023)/OL/61/S/Q/S-2

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Geography

# භූගෝල විද්‍යාව



**Questions Paper - I, II | ප්‍රශ්න පත්‍ර - I, II (සිංහල මාධ්‍යය)**

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| **Geography** | **I, II** |

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. | අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் | |
| Additional Reading Time | – 10 minutes | |

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40කින්** සමන්විත ය.

* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. සුපර්සොනික් ජෙට් යානා පියාසර කරනුයේ ...................................... ගෝලය තුළය.
(පරිවර්ති / අපරිවර්ති / මෙසෝ)
2. වොල්ගා ගඟ ..................................... මුහුදට ගලා බසියි. (ඒරල් / කළු / කැස්පියන්)
3. නාවික සැතපුම් 24 සිට නාවික සැතපුම් 200 දක්වා විහිදෙන්නේ................................... .
(රාජ්‍ය මුහුදු / පරම ආර්ථික / යාබද මුහුදු)
4. මැහෝගනී,ඇකේෂියා වැනි ශාක දක්නට ලැබෙන්නේ ................................... වනාන්තර තුළය.
(නිවර්තන / සෞම්‍ය /කේතුධර)
5. යපස් නිධියක උසස් වර්ගයේ යකඩ ..................................... ක් අඩංගු වේ නම් ආර්ථික වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ය. (20% / 30% / 50%)


- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

6. වියළි කලාපයේ මීටර් 1400 ට වඩා උස් කඳුකර බිම්වල කඳුකර වියළි කලාපීය වනාන්තර ව්‍යාප්තවී ඇත. නි / වැ
7. 1 : 50,000 හූ ලක්ෂණ සිතියමෙහි කලා 5 න් 5 ට අක්ෂාංශ හා දේශාංශ වටිනාකම් සඳහන් කර ඇත. නි / වැ
8. දේශගුණික වර්ගීකරණයක් මුලින් ම ඉදිරිපත් කරන ලද්දේ ඔස්ටින් මිලර් විසිනි. නි / වැ
9. ලෝම් ලැටරයිට් පස තේ වගාවට යෝග්‍ය වේ. නි / වැ
10. ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 80% ක් ජන හීන ප්‍රදේශ වේ. නි / වැ

- අංක 11 සිට 15 තෙක් හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පෘථිවිය මත ව්‍යාප්ත ව ඇති සමස්ත ජල ස්කන්ධය ඝන කිලෝමීටර් මිලියන .................................... ක් පමණ වේ.
12. යමහල් ක්‍රියාකාරිත්වය නිසා අත්ලන්තික් සාගරයේ නිර්මාණය වී ඇති දූපතක් වන්නේ .................................... යි.
13. කෙටි කාලයක් තුළ ජන සංඛ්‍යාවේ සිදු වන ශීඝ්‍ර වර්ධනය ........................................................ ලෙස හැඳින්වේ.
14. සුළු අපනයන බෝග පර්යේෂණ මධ්‍යස්ථානය .................................... පිහිටා ඇත.
15. දක්ෂිණ දුම්රිය මාර්ගයේ අවසන් නැවතුම .................................... දුම්රිය ස්ථානය යි.

- **අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**



2006 - 2011 දක්වා දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය

ඉහත ප්‍රස්තාරයට අනුව,

16. සේවා අංශයෙන් ඉහළ ම දළ දේශීය නිෂ්පාදනයක් ලැබී ඇත්තේ .......................................... වර්ෂයේ දී ය.

17. දළ දේශීය නිෂ්පාදනයට අඩු ම දායකත්වයක් දක්වා ඇත්තේ .......................................... අංශය යි.

18. අංශ තුනෙන් ම ඉහළ ම දළ දේශීය නිෂ්පාදන දායකත්වයක් වාර්තා වී ඇත්තේ.......................... වර්ෂයේ දී ය.

- **අංක 19 සිට 22 තෙක් දී ඇති ප්‍රශ්නවල ‘අ’ සහ ‘ආ’ යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ‘අ’ තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව ‘ආ’ තීරුවේ තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

19.

| අ | ආ |
|---|---|
| 1. ආසියාව | A. මැඩගස්කරය |
| 2. ඕස්ට්‍රේලියාව | B. ජාවා |
| 3. අප්‍රිකාව | C. තස්මේනියාව |
| | D. පැපුවා නිව් ගිනියාව |

1. ABC 2. BCA 3. CAB 4. DCA (………….)

20.

| අ | ආ |
|---|---|
| 1. ආග්නේය | A. ඩොලමයිට් |
| 2. විපරීත | B. හුණුගල් |
| 3. අවසාදිත | C. ග්‍රැනයිට් |
| | D. මිනිරන් |

1. ABD 2. BAD 3. BDC 4. CAB (………….)

21.

| අ | ආ |
|---|---|
| 1. වියළි මිශ්‍ර සදාහරිත | A. කිරල |
| 2. කඩොලාන | B. මහරත්මල් |
| 3. කටු පඳුරු හා ළඳු කැළෑ | C. කළුවර |
| | D. පලු |


1. ABD 2. BAD 3. CAD 4. DAC (………….)

22.

| අ | ආ |
|---|---|
| 1. ඕස්ට්‍රේලියාවේ උතුරු වෙරළ | A. විලි විලීස් |
| 2. ජපන් දූපත් අවට | B. සයික්ලෝන් |
| 3. බෙංගාල බොක්ක අවට | C. බැගියෝ |
| | D. ටයිෆූන් |

1. ADB 2. BAC 3. CAD 4. DCA (………….)

- **අංක 23 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**




23. ඉහත ජාතික (මෙට්‍රික්) ඛණ්ඩාංක අනුව X ලකුණින් දැක්වෙන ස්ථානයෙහි පිහිටීම නිවැරදි ව දැක්වෙන්නේ,

1. 175000 mE
   395000 mN
2. 175000mE
   390000 mN
3. 175000 mN
   390000 mE
4. 175000 mN
   395000 mE (…………)

24. ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිතයක් වන්නේ ,

1. විල්පත්තු
2. සිංහරාජය
3. හග්ගල
4. කන්නෙලිය (…………)

25. උල්පතකින් ආරම්භ වන ගංගාවක් වන්නේ,

1. රයින්
2. තේම්ස්
3. නයිල්
4. මිසිසිපි (…………)

26. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියමක ජාතික ( මෙට්‍රික්) ඛණ්ඩාංක දක්වා ඇති වර්ණය,

1. කළු
2. රතු
3. නිල්
4. දුඹුරු (…………)

27. ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ අතුරෙන් උඩරට තේ වගා කරන දිස්ත්‍රික්කයක් වන්නේ ,

1. නුවරඑළිය
2. බදුල්ල
3. මහනුවර
4. කෑගල්ල (…………)

28. සංයුතිය දක්වන දත්ත ව්‍යාප්තියක් නිරූපණය කිරීමට වඩාත් සුදුසු ප්‍රස්තාර ක්‍රමය,

1. සරල රේඛා
2. බහු තීරු
3. ද්විත්ව තීරු
4. බෙදූ වෘත්ත (…………)

29. 21 වන සියවස සඳහා පරිසර සංවර්ධනය පිළිබඳ වැඩපිළිවෙළක් සකස් කළ ජාත්‍යන්තර සමුළුව වන්නේ,

1. ස්ටොක්හෝම් 2. බිම්ස්ටෙක්

3. මිහිකත 4. බ්‍රික්ස් (………….)

30. භූමිකම්පාවක තීව්‍රතාව මැනීම සඳහා පරිමාණයක් හඳුන්වා දෙනු ලැබුවේ,

1. රිචඩ් හාර්ට්ෂොන් 2. චාල්ස් එෆ්. රිච්ටර්

3. වොන් හම්බෝල්ට් 4. ඇල්ෆ්‍රඩ් වෙග්නර් (………….)

31. මුළු වායු පරිමාවෙන් 50% ක් අන්තර්ගත වන්නේ පෘථිවි තලයේ සිට කොපමණ උසකින් ද ?

1. 5-6 km 2. 8-10 km

3.10-12 km 4. 12-14 km (………….)

32. මානුෂ සංවර්ධන දර්ශකයේ මූලික අංග තුනට ඇතුළත් **නොවන්නේ,**

1. උපතේ දී ආයු අපේක්ෂාව 2. සාක්ෂරතාව


3. ක්‍රය ශක්තිය 4. භෞතික ජීවන තත්ත්ව දර්ශකය (………….)

33. 2012 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා දත්ත අනුව ජන සංඛ්‍යාව මිලියනය ඉක්ම වූ දිස්ත්‍රික්කයක් වන්නේ,

1 .ගාල්ල 2. යාපනය

3. නුවරඑළිය 4. කෑගල්ල (………….)

34. මෙම දිශා සටහනින් දැක්වෙන සම්පූර්ණ ඊ හිස සහිත දිශාව වන්නේ ,



1. සැබෑ උතුර 2. චුම්බක උතුර

3. ජාල උතුර 4. සත්‍ය උතුර (………….)

35. යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක් වන 'කුෂ්නෙට්ස්ක් කලාපය' පිහිටි රට වන්නේ,

1. එක්සත් රාජධානිය 2. චීනය

3. ඇ.එ.ජනපදය 4. රුසියාව (………….)

36. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්තශාලාව පිහිටා ඇත්තේ ,

1. කොළොන්නාව 2. සපුගස්කන්ද

3. කිරිබත්ගොඩ 4. ඔරුගොඩවත්ත (………….)

- **පහත A, B, C, D වලින් දක්වා ඇති මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කර 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. නාගරීකරණය
2. පරිසර දූෂණය

B - 1. ජන සංඛ්‍යා වර්ධන වේගය
2. වියපත් ජන සංඛ්‍යාව

C - 1. ගෝලීය උෂ්ණත්වය
2. ළැව්ගිනි

D - 1. උන්නතාංශය
2. වායු පීඩනය

37. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතු වන මාතෘකා යුගලය වන්නේ ,

1. A 2. B 3. C 4. D (………….)

38. පළමුවැන්න හා දෙවැන්න අතර සෘජු සම්බන්ධතාවක් නොදක්වන මාතෘකා යුගලය වන්නේ ,

1. A 2. B 3. C 4. D (………….)

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීමට ද, දෙවැන්නේ වැඩි වීම පළමුවැන්නේ වැඩිවීමට ද හේතු වන මාතෘකා යුගලය වන්නේ ,

1. A 2. B 3. C 4. D (………….)

40. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය වන්නේ ,

1. A 2. B 3. C 4. D (………….)

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

**භූගෝල විද්‍යාව II**

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- ❖ I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ❖ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

I - කොටස

**1.**

**(අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.**

i. A අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද ?
(පුළුල් ද්විත්ව දුම්රිය මාර්ගය / පටු දුම්රිය මාර්ගය / පුළුල් ඒකීය දුම්රිය මාර්ගය) ( ලකුණ 01)

ii. B අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද ?
(පළාත් මායිම / දිස්ත්‍රික්ක මායිම / නගර සභා සීමාව ) ( ලකුණ 01)

iii. C අක්ෂරයෙන් දක්වා ඇති රේඛාව කුමක් ද ?
(සම ගැඹුරු රේඛාව / සමෝච්ච රේඛාව / අතිරේක සමෝච්ච රේඛාව) ( ලකුණ 01)

iv. D අක්ෂරයෙන් දැක්වෙන ජලවහන ලක්ෂණය කුමක් ද ?
(ගං දඟය / ඩෙල්ටාව / ගං මෝය) ( ලකුණ 01)

v. ඉදි කළ ප්‍රදේශය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන **තුනක්** සඳහන් කරන්න.
(ලකුණු 03)

- **සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

vi. මෙම ප්‍රදේශයේ වී වගාව සිදු කරන්නේ ගංගා ජලය උපකාරයෙනි. නි / වැ

vii. අංක ① චතුරස්‍රය තුළ වැඩි වශයෙන් ජීවත් වන්නේ බෞද්ධාගමිකයන් ය. නි / වැ

viii. අංක ② න් දැක්වෙන්නේ මගීන් ගෙන යන තොටුපළකි. නි / වැ

(ලකුණු 03)

1. (අ)



Moratuwa Railway Station
Horetuduwa
Moratuwella South
Digarolla
BOLGODA LAKE
Dampe
Madapata
Makandana
Batuwandara
Jamburaliya
B
Telecommunication Training Centre
Koralawella North
Koralawella
KESBEWA DIVISION
Koralawella Railway Station
Gorakana
Paratta
Keselwatta
2
Wadumulla
Mahakithgama
Jambureliya
Koralawella South
Kaduruduwa
Kahapola
Kindelpitiya
Sarikkamulla
BOLGODA GANGA
Gedambe
MORATUWA DIVISION
1
Pallimulla
PANADURE GANGA
Egodauyana Railway Station
Gorakapola
Wekerawatta
Hirana
Gonabedi Ferry
Koppala
Totawatta
Ambalanduwa
Galtude
Hirana Galtude
Katukurunda
Walana
Wattalpola
Children Homes
Bokkegama
Egoda Uyana
Thantrimulla
PANADURA DIVISION
(TOTAMUNA)
Minuwanpitiya
Kiriberiya
Newdawa
Wewdawa
Arukgoda
Maha Arukgoda
Egoda Uyana
Pattiya North
Udahamulla
Pattiya
Malamulla
D
Kuruppumulla
Electricity Board
Pump Station
Wanduramulla
Telecommunication Exchange
Atambagoda
Walpola
Panadura
A8
Wekada
Pinwala
Miriswatta
Kuda Arukgoda
Alubomulla
Wekada West
Pattiya South
Agrarian Services Centre
Uyankele South
Wekada
Mahawila
Alubomulla
Avariyawatta
C
Katudewala
Kaludewala
Horawinna
Wellipitiya
Madupitiya
Pamunugama
Dibbedda
Nalluruwa
Pamunugama
Imbulliha
A
Limpaswatta
Mahawatta
Pinwatta
BOLGODA LAKE
Pinwatta Railway Station
Deevara
Janapadaya
Navampitiya
Weragama


1:50,000

භූගෝල විද්‍යාව II

Geography II

1· (අ)

I. ------------------------------------------------------------------------------------------

II. ------------------------------------------------------------------------------------------

III. ------------------------------------------------------------------------------------------

IV. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

V. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

VI. ------------------------------------------------------------------------------------------

VII. ------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

i. හරිකේන් සුළි කුණාටු ඇති වන සාගර ප්‍රදේශය - H I K

ii. අප්‍රිකාවේ නයිල් ගංගාව ආශ්‍රිත ද්විතීයික අධිජන සංකේන්ද්‍රණ කලාපය - L M N

iii. තේ වගාව සඳහා මෑත කාලයේ ප්‍රසිද්ධියට පත් වූ කෙන්යාව - O P S

iv. මරේ ඩාලිං ගංගා නිම්නය - T V W

v. අල්තායි කඳු වැටිය - X Y Z (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

i. බෝඹුවල වී පර්යේෂණායතනය - A B C


ii. කෝකිලායි මසුන් ගොඩ බාන මධ්‍යස්ථානය - D E F

iii. කටුගම්පල බුලත් අපනයන ගම්මානය - G H I

iv. මුලතිව් දිස්ත්‍රික්කය - J K L

v. දෙදියගල රක්ෂිතය - M N O (ලකුණු 05)

(ආ)




(i) ☐

(ii) ☐


(iii) ☐

(iv) ☐

(v) ☐

/5

(ඉ)




(i) ☐

(ii) ☐

(iii) ☐


(iv) ☐

(v) ☐

/5

1. (අ) /10 + (ආ) /5 + (ඉ) /5 = /20

## II - කොටස




**2.** මෙම රූපයෙන් දක්වා ඇත්තේ පාංශු පැතිකඩක හරස්කඩකි.

i). (a) හියුමස් පස දක්නට ලැබෙන මහලේ අක්ෂරය ද,

(b) ලවණ හා මැටි වර්ග තැන්පත් ව ඇති මහලේ අක්ෂරය ද ලියා දක්වන්න.

(ලකුණු 2)

ii). දේශීය කර්මාන්ත සඳහා මිනිරන් භාවිත වන අවස්ථා **තුනක්** සඳහන් කරන්න.

(ලකුණු 3)

iii). (a). ඛනිජ සම්පත් අසීමිත ලෙස පරිභෝජනය හේතුවෙන් සිදු වන පාරිසරික ගැටලු **තුනක්** සඳහන් කරන්න.

(b). ඉන් **එක්** ගැටලුවක් පරිසරයට ඇති කරන අහිතකර බලපෑම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5)

**3.** i). ශ්‍රී ලංකාවේ වී වගා බිම් අතුරෙන්,

(a). අඩු ම ව්‍යාප්තියක් ඇති දිස්ත්‍රික්කය,

(b). වැඩි ම ව්‍යාප්තියක් ඇති දිස්ත්‍රික්කය නම් කරන්න . (ලකුණු 2)

ii). ශ්‍රී ලංකාවේ වී වගාව සිදු කරන ප්‍රධාන කලාප **තුනක්** නම් කරන්න . (ලකුණු 3)

iii). (a). වර්තමානයේ ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය අඩු වීමට බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න.

(b). පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ඔබ යෝජනා කරන **එක්** ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

**4.** i). නිෂ්පාදන කර්මාන්තයක් යන්න හඳුන්වන්න . (ලකුණු 2)

ii). කර්මාන්ත ස්ථාන ගත වීම කෙරෙහි බලපාන සාධක අතරින් අමුද්‍රව්‍ය වර්ග **තුනක්** නම් කරන්න .

(ලකුණු 3)

iii). වර්තමානයේ දී දෙමුහුන් (Hybrid) වාහන හා විදුලි (EV) වාහනවලට ඇති ඉල්ලුම ඉහළ යාමට බලපා ඇති හේතු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න . (ලකුණු 5)

**5.** i). මැටි කර්මාන්තය ආශ්‍රිත ව භාවිත වන,

(a) කෙඔලින් මැටි

(b) බෝල මැටි නිධි ව්‍යාප්ත වී ඇති **එක්** ප්‍රදේශය බැගින් නම් කරන්න . (ලකුණු 2)

ii). පෙට්‍රෝ රසායන කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන **තුනක්** සඳහන් කරන්න . (ලකුණු 3)

iii). (a) වර්තමානයේ පවතින ඛනිජ තෙල් අර්බුදය නිසා පෙට්‍රෝ රසායන කර්මාන්ත මුහුණ දෙන ගැටලු **තුනක්** නම් කරන්න.

(b) ඔබ ඉහත සඳහන් කළ **එක්** ගැටලුවක් පැහැදිලි කරන්න . (ලකුණු 5)

**6.** i). ජන සංඛ්‍යාව පිළිබඳ සැලකීමේ දී ප්‍රධාන වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර දෙකක් ඇත .ඉන්,

(a). මිනිසාට උපතින් උරුම වන ලක්ෂණයක් ද,

(b). උපතින් පසු ව උරුම කර ගනු ලබන ලක්ෂණයක් ද සඳහන් කරන්න. (ලකුණු 2)

ii). ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධන අනුපාතිකය පහළ බැසීමට හේතු වී ඇති කරුණු **තුනක්** නම් කරන්න . (ලකුණු 3)

iii). තෙත් කලාපයට අයත් කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ අගයක් ගැනීමට හේතු **දෙකක්** පැහැදිලි කරන්න . (ලකුණු 5)

**7.** i). ස්වාභාවික ආපදාවක් යනු කුමක් දැයි හඳුන්වන්න . (ලකුණු 2)

ii). මෙම උපද්‍රව වර්ග කර දක්වන්න.

(භූමි කම්පා , නියඟ , වසංගත රෝග , අකුණු සැර , ගිනිකඳු , මහා පරිමාණයෙන් සතුන් වඳවීම)


(a). භූ විද්‍යාත්මක උපද්‍රව -

(b). දේශගුණ විද්‍යාත්මක උපද්‍රව -


(c). ජෛව විද්‍යාත්මක උපද්‍රව - (ලකුණු 3)

iii) (a) ආපදා කළමනාකරණ චක්‍රයේ A, B, C අවස්ථාවන් පිළිවෙළින් නම් කරන්න.

(b) ආපදා කළමනාකරණ චක්‍රයේ යථා තත්ත්වයට පත් කිරීමේ අවස්ථාවේ දී ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 5)




**8.** i). ලෝකයේ භූමිකම්පා ඇතිවන කලාප ලකුණු කර ඇති මෙම සිතියමෙහි A හා B කලාප **දෙක** පිළිවෙළින් නම් කරන්න .




(ලකුණු 2)

ii). ගෝලීය උෂ්ණත්වය ඉහළ දැමීම කෙරෙහි බලපෑම් ඇති කරන අහිතකර වායු වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 3)

iii). (a). දේශගුණික වෙනස් වීම් මානුෂ කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම් **දෙකක්** සඳහන් කරන්න .

(b). දේශගුණික වෙනස් වීම් අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 5)

*****